
# පරිසිවරුන්ගේ
# ලක්ෂණ පනහක්



සැක් පූනන්
**ZAC POONEN**

# FIFTY MARKS OF PHARISEES

Sinhala

by **Zac Poonen**

Translated by Claude Kemps

Published by :

**CHRISTIAN FELLOWSHIP CHURCH**

**IN SRI LANKA.**

Address.
Christian Fellowship Church,
Daduru Oya,
Chilaw,
Sri Lanka.
Telephone : +94 77 6344328, +94 77 3631575
e-mail : claudekemps@gmail.com



# FIFTY MARKS OF PHARISEES

## BY ZAC POONEN

Copyright© 2010

This book has been copyrighted to prevent misuse. It should not be reprinted or translated without written permission from the author.

*for further details :*
Please contact the author.

**Zac Poonen**
16, Da Costa Square,
Bangalore - 560084
India
E-mail : cfc@cfcindia.com
Web : www.cfcindia.com

# පරිසිවරුන්ගේ ලක්ෂණ පනහක්

1. පරිසිවරු දේවභක්තික මිනිසුන් සමඟ ඇති ඔවුන්ගේ සම්බන්ධය ගැන වර්ණනා කරගන්නෝය ආබ්‍රහම් පියා හැටියට සිටින්නේය. මතෙව් 3:9

2. පරිසිවරු බාහිර ධර්මිෂ්ඨකම ගැන වර්ණනා කර ගන්නෝය. ඔබගේ ධර්මිෂ්ඨකම පුරාණ ධර්මාචාර්ය -වරුන්ගේ සහ පරිසිවරුන්ගේ ධර්මිෂ්ඨකම ඉක්මවා නොයන්නේ නම් මිස, ඔබ කිසිසේත් ස්වර්ග රාජ්‍යයට ඇතුලු නොවන්නේ යයි යේසුස් වහන්සේ කිව්සේක. මතෙව් 5:20.

3. පරිසිවරු පව්කාර මිනිසුන් ඇසුරු නොකරන්නෝය. ඔබගේ ගුරුවරයා පව්කාර මිනිසුන් සමඟ කෑම ගන්නේ ඇයි දැයි, පරිසිවරු යේසුස් වහන්සේගේ ගෝලයන්ගෙන් ඇසූහ. මතෙව් 9:11

4. පරිසිවරු ශ්‍රමණයෝ වෙත්. පරිසිවරු උපවාසය කරනමුත්, ඔබවහන්සේගේ ගෝලයෝ උපවාසය (නිරාහාරව සිටීම) නොකරන්නේ මන්ද? මතෙව් 9:14

5. පරිසිවරු අනුන් කෙරෙහි සුළු දේටත් ඉතා විවේචනාත්මක වූහ "බලන්න ඔබවහන්සේගේ ගෝලයෝ සබත් දවසෙහි නිත්‍යයානුකූල නොවන දේ, කරත් යැයි පරිසිවරු යේසුස් වහන්සේට කීවූහ. මතෙව් 12:2

6. පරිසිවරු රෙගුලාසි තුළ ජීවත් වන්නෝය, ඔවුන් යේසුස් වහන්සේගෙන් ප්‍රශ්ණ කර අසා සිටියේ, සබත් දවසෙහි සුවකිරීම නිත්‍යයානුකූලද? යන්නය-එහෙයින් උන්වහන්සේ



මත වරද පටවන්න (දෝෂාරෝපණය) හැකි වන්නේය. මතෙව් 12:10

7. පරිසිවරු ඊර්ශ්‍යාව සහ වෛරය (ද්වේෂ කිරීම) අභිප්‍රාය කරගත් අය වෙත්, පරිසිවරු එළියට ගොස් යෙසුස් වහන්සේව විනාශ කළහැක්කේ කෙසේද කියා කුමන්ත්‍රණය කළහ. මතෙව් 12:14

8. පරිසිවරු සැක සහිත අය බැවින්, අන් මිනිසුන් ගැන ඉතා දරුණුම දේ උපකල්පනය කරන්නෝය. මේ මිනිසා යක්ෂයන් දුරු කරන්නේ යක්ෂධිපතියා වන බෙල්සෙබුල්ගේ අනුහසින් පමණකි යයි ඔවුහු කීවෝය, මතෙව් 12:24

9. පරිසිවරු ඔවුන්ගේ වචන ගැන ඉතා නොසැලකිලි වන්ත -යෝය. මේ මිනිහා යක්ෂයන් දුරු කරන්නේ යක්ෂධිපති වන බෙල්සෙබුල්ගේ අනුහසින් යයි ඔවුහු කීවෝය. මතෙව් 12:24

10. පරිසිවරු ආගම නමින් ඔවුන්ගේ පවුල් වගකීම් පැහැර හරින්නෝය. "නුඹගේ මව සහ පියාට ගෞරවය කරන්න" යයි දෙවියන් වහන්සේ කිව්සේක ..... එහෙත් කවරෙක් වුවද තමාගේ පියාට හෝ මවට කථාකොට "මම ඔබගේ යහපත පිණිස දිව යුතුව තිබුණ දීමනාව දෙවියන් වහන්සේට පඬුරක් ලෙස කැප කළෙමියි." කීමෙන් පසුව "පියාට හෝ මවට ගෞරව කිරීමට බැඳී නැතැයි" කියන්නහුය. මතෙව් 15:1-9

11. පරිසිවරු ඉතා ලෙහෙසියෙන් අමනාප වන්නෝය, එවිට ගෝලයෝ අවුත්, ඔබගේ ඒ කීම අසා පරිසිවරු තදින් අමනාප වූ බව ඔබ වහන්සේ දන්නා සේක් දැයි, යේසුස් වහන්සේ ගෙන් ප්‍රශ්න කළහ, යෙසුස් වහන්සේ පිළිතුරු

දෙමින් "ඔවුන් ගෙන් අපට වැඩක් නැත, ඔවුන්ගේ පාඩුවේ ඉන්න හරින්න " කීසේක, මතෙව් 15:12-14

12. පරිසිවරු ආත්මික අන්ධයෝ වෙත්, ඔවුහු අන්ධයින්ගේ අන්ධ මාර්ගදේශකයෝය.(මග පෙන්වන්නන්ය) අන්ධයෙකු තවත් අන්ධයෙකුට මග පෙන්වීමට ගියහොත්, දෙදෙනාම වළක වැටෙනු ඇත. මතෙව් 15:14

13. පරිසිවරු කෛරාටිකයෝය (කුහකයන්). පරිසිවරුන්ගේ කුහකකම නැමැති මුහුන්වලින් (පිටි පිපීමට යොදන) පරිස්සම්වන්න. ලූක් 12:1

14. පරිසිවරු අනුන්ගේ වචන තුළින් ඔවුන්ව හසුකිරීමට මාන බලන්නෝය. ඇතැම් පරිසිවරු යේසුස් වහන්සේ වෙතට පැමිණ උන්වහන්සේව වචනයකින් අල්ලාගන්නා පිණිස "යමෙක් විසින් කුමන කරුණක් නිසාවත් සිය භාර්යයාව දික්කසාද කිරීම නීතියට අනුකූල දැයි" විමසුවෝය. මතෙව් 19:3

15. පරිසිවරු දැඩි සිත් (හදවත්) ඇත්තෝය. මුවින් මොවුහු මට ගරු කරති, නමුත් ඔවුන්ගේ සිතින් (හදවතින්) මාගෙන් දුරස්ථව සිටිති. මතෙව් 15:8

16. පරිසිවරු සෙනඟ මාධ්‍යයේ (ප්‍රසිද්ධියේ) ඝෝෂා සහිත ප්‍රසංසා අගය කිරීමට අකමැත්තෝය. දාවිත්ගේ පුත්‍රයා - ණන්ට හෝසන්නා යයි දරුවන් මොර ගසනවා දැක, උත්තම පූජකවරු සහ විනයධරයෝ (ලියන්නන්) කුපිත වූහ. මතෙව් 21:15



17. පරිසිවරු කීකරුකමින් තොර ඥානය ඇත්තෝය. පරිසිවරු මෝසෙස්ගේ ව්‍යස්ථාවලිය පිළිබඳ බලයලත් අටුවාචාරීහු වෙති. එබැවින් ඔවුන් ඔබට අණකරන සියල්ල නොපිරිහෙළා පිළිපදින්න, එහෙත් ඔවුන්ගේ ක්‍රියා අනුව නොයන්න. ඔවුහු එකක් කියති, අනෙකක් කරති. මතෙව් 23:2-3

18. පරිසිවරු ඔවුන් දේශනාකරන දේ නොපිළිපදිති. පරිසිවරු එකක් කියති, අනෙකක් කරති, මතෙව් 23:3

19. පරිසිවරු ඉසිලිය නොහැකි බර අනුන් මත පටවන්නෝය. ඔවුහු ඉසිලිය නොහැකි බර පොදි බැඳ මිනිසුන්ගේ කරේ තබති. එහෙත් ඔවුහු සුළැඟිල්ලක තරමින්වත් ඉසිලීමට උපකාරයක් වීමට කැමති නොවෙති. මතෙව් 23:4

20. පරිසිවරු මිනිසුන්ගෙන් ගෞරවය සොයන්නෝය. ඔවුහු සියල්ල කරනුයේ මිනිසුන්ට පෙනෙනු පිණිසය. මතෙව් 23:5

21. පරිසිවරු ශුද්ධවන්තකම කෙනෙකුගේ වස්ත්‍රයේ මෝස්තරය මත රඳා පවතින බව සිතන්නෝය. පරිසිවරු ෆිලැක්ටරි (ශුද්ධ ලියවිලි පාඨ සඳහන් බඳන, නළලෙහි පළඳින දේව වචනය අඩංගු කුඩා සම් පසුම්බිය) පළල්කර නළලෙහි බැඳ සහ ඔවුන්ගේ වස්ත්‍රවල දවලු දික් කරති. මතෙව් 23:5

22. පරිසිවරු තනතුරු (නිල) සහ ගෞරවනීය නම්බුනාමවලට ප්‍රේම කරන්නෝය. ඔවුහු ධර්මශාලාවේ භෝජන සංග්‍රහවලදී, ප්‍රධාන අසුන්වල අසුන් ගැනීමට ප්‍රේම කරති. උඩඟු ලෙස ප්‍රසිද්ධියේ කයිවාරු කම්වලින් තේජශීලිව හැසිරෙන්නෝය. ගෞරවනීය උපාධි ලබමින් හා "ආචාර්යවරයා" හා "ගරු" යන නම්වලින් ඔවුන්ම

ආමන්ත්‍රණය කරගනිති. මතෙව් 23:6-8
(අනුවාදත්මක ප්‍රකාශ කිරීමක්, භාවසන්නය)

23.පරිසිවරු අනුන්ව කිලිටි (දූෂණය) කරන්නෝය. පරසිවරු නුඹට වන විපතක මහත! මන්ද නුඹ ස්වර්ග රාජ්‍යයේ දොරටු මිනිසුන්ගේ ඇස් හමුවෙහි වසන්නහුය; ඔබම ඇතුළු වන්නේවත්, ඇතුළුවන්න සොයන අයට ඉඩ දෙන්නේවත් නැත. මතෙව් 23:14

24.පරිසිවරු දුප්පත් මිනිසුන්ගෙන් අයුතු ප්‍රයෝජන (ලාභ,වාසි) ගන්නෝය. පරිසිවරු නුඹට වන විපතක මහත! මන්ද ඔබ වැන්දඹුවන්ගේ ගේදොර කාදමති (වනසති). මතෙව් 23:14

25.පරිසිවරු ප්‍රසිද්ධියේ චමත්කාරී (සිත් ඇඳගන්නා) දිග යාච්ඤා කරන්නෝය. පරිසිවරුනි නුඹට වන විපතක මහත! මන්ද ඔබලා රැවටිලිව (බොරුවට, ඇඟවීම) දිගින් දිගට යාච්ඤා කරන්නෝය. එබැවින් ඔබට ඉතා මහඟු දණ්ඩනයක් (වරදක්) ලැබෙනු ඇත. මතෙව් 23:14

26.පරිසිවරු ධර්මප්‍රචාරය කර, මිනිසුන් නිරයට සුදුසු දරුවන් මෙන් දෙගුණයක් කරන්නෝය. පරිසිවරුනි නුඹට වන විපතක මහත! මන්ද එක්කෙනෙකු ආගමට හරවාගන්නා පිණිස ඔබලා මුහුදෙන් හා ගොඩින් හැම තැනම ගමන් කරන්නෙහුය. එසේ හරවාගත් පසු, ඔහු ඔබලා මෙන්, දෙගුණයක් නිරයට සුදුසු දරුවන් කරන්නෙහුය. මතෙව් 23:15

27.පරිසිවරු දෙවියන් වහන්සේගෙන් එළිදරව් නොමැතිව ශුද්ධ ලියවිල්ලේ (දේව වචනය) අර්ථය පහදා දෙන්නෝය. අන්ධ මාර්ගෝපදේශකයිනි නුඹට වන විපතක මහත! මන්ද



යමෙකු දේවමාලිගාවේ නාමයෙන් දිවුළොත් ඒ දිවුරුමෙන් එහි කිසි වරදක් නැත කියාද, යමෙකු දේවමාලිගාවේ රන්වල නාමයෙන් දිවුළොත් ඔහු බැඳී සිටියි කියාද ඔබලා කියන්නෙහුය අඥාන සහ අන්ධ මිනිසුනි! කවරෙකු හෝ දේවමාලිගාව නාමයෙන් දිවුළොත්, දේවමාලිගාව සහ එහි වැඩවසන දෙවියන් වහන්සේගේ නාමයෙන් යන දෙකෙන්ම දිවුරන්නේය. මතෙව් 23:16

28.පරිසිවරු සුළු දේ ගැන නුවුවමනාවට වඩා ගරු කරන ව්‍යවස්ථාවේ ලිඛිත නීතිය පිළිපදින්නෝය. පරිසිවරුනි නුඹ සුවඳතලා, සුදුදුරු, සහ ශතපුෂ්ප යන මෙයින් දසයෙන් කොටස දෙන්නෙහුය, එහෙත් ව්‍යවස්ථාවේ වඩා බරපතල කාරණා ඔබලා පැහැර හරින්නහුය; මතෙව් 23:23

29.පරිසිවරු යුක්තිය, දයාව, හා ඇඳහිලිවන්තභාවය (විශ්වාසවන්තකම) නොමැති අයය. පරිසිවරු නුඹලා ව්‍යවස්ථාවේ වඩා බරපතල කාරණා පැහැර හරින්නහුය: යුක්තිය, දයාව හා විශ්වාසවන්තභාවය; නමුත් නුඹ කළ යුතුව තිබුණේ මේ දේවල්ය. මතෙව් 23:23

30.පරිසිවරු මඳුරුවන් පෙරා ඔටුවන් ගිලිති. නුඹ පරිසිවරුනි, කෛරාටික සහ අන්ධ මාර්ගෝපදේශකයිනි, නුඹ කෝඳුරුවා පෙරා දමා ඔටුවා ගිල ගන්නෙහුය.
මතෙව් 23:24

31.පරිසිවරු හොඳ බාහිර සාක්ෂියක් පමණක් ලබාගනු පිණිස යොමුවන්නෝය. පරිසිවරුනි නුඹ කෝප්පය සහ පිගාන පිටතින් පවිත්‍ර කරන්නෝය, එහෙත් ඇතුළත සොරකම් (දූෂණ) සහ තමාගේ අභිලාෂයන් සිත්සේ පිනවන තෘෂ්ණාවලින් පිරී තිබේ, මතෙව් 23:25,26

32.පරිසිවරු, අනුන් දූෂිත ක්‍රියා කළ කාලයේ අප සිටියේ නම්, අප කිසිසේත් එවැන්නක් නොකරන්නෙමුයි කියන්නෙහුය. නුඹ පරිසිවරුනි, දිවැසිවරුන්ගේ සොහොන් ඉදිකොට සහ ධම්ධූවන්ගේ සොහොන් කොත් අලංකාර කරමින් කියනුයේ, අපගේ පියවරුන්ගේ කාලයේ අපි ජීවත්ව සිටියෙමු නම්, දිවැසිවරුන්ගේ ලේ වැගිරීම්වලට අපි ඔවුන් සමඟ පංගුකාර නොවන්නෙමු යයි කියන්නහුය. මතෙව් 23:29,30

33.පරිසිවරු දෙවියන් වහන්සේගේ දිවැසිවරුන්ට වධ හිංසා කරන්නෝය, මම දිවැසිවරුන් ඔබ වෙත එවමි...... ඔබ ඔවුන්ගෙන් ඇතමෙකු මරන්නෙහුය, ඇතමෙකු කුරුසිපත් කරන්නෙහුය, ඇතමෙකුට වධ හිංසා කරමින් ඔවුන් නුවරින් නුවරට පළවා හරින්නෙහුය, මතෙව් 23:34,35

34.පරිසිවරු මිනිසුන්ගේ මතවලට (නිගමන, උපදේශ) වැඩි සැලකිල්ලක් දක්වන්නෝය. "යොහාන් බව්තීස්ත ස්නාපනය කවරෙක්ගෙන්ද, ස්වර්ගයෙන්ද, මනුෂ්‍යයන්ගෙන්ද"? පරිසිවරු තමන් අතර සාකච්ඡා කොට, අප "මනුෂ්‍යයන්-ගෙන්" යයි කීවොත් සෙනගට බියවීමට සිදුවෙනවා; මන්ද සියලු දෙනාම යොහාන් දිවැසිවරයෙක් බව පිළිගෙන ඇති හෙයින්, අපි නොදනිමු යයි යේසුස් වහන්සේට උත්තර දුන්හ. මතෙව් 21:25-27

35.පරිසිවරු ධනලෝභියෝය (මුදල්වලට ප්‍රේම කරන්නෝ) පරිසිවරු මුදල්වලට ප්‍රේම කරන්නෝ වූහ ලූක් 16:14

36.පරිසිවරු අනුන්ට වඩා තමා හොඳ යයි සිතින් මවාපාගන් -නෝය. අන් හැම දෙනා හෙළා දුටු (පිළිකුල්, නිග්‍රහ, අපහාස), ඇතැම් අයට යේසුස් වහන්සේ මෙම උපමාව වදාළසේක. මිනිසුන් දෙදෙනෙක් යාච්ඤාව පිණිස



දේවමාලිගාවට ගියහ. එක්කෙනෙක් පරිසිවරයෙකි ..... ඔහු මෙසේ තමන්ටම යාච්ඤා කරමින්, දෙවියන් වහන්ස මම අන් අය වගේ නොවන බැවින් ඔබට ස්තූති කරමි. ලූක් 18:9-11

37.පරිසිවරු ඔවුන්ගේම ධර්මිෂ්ඨකමෙහි විශ්වාස තබන් -නෝය. තමන්ම ධර්මිෂ්ඨ යැයි විශ්වාස කරන ඇතැම් අයට, උන්වහන්සේ මෙම උපමාවද වදාළසේක. ලූක් 18:9

38.පරිසිවරු අනුන්ව පහත් කොට සළකන්නෝය. අන් අයව හෙළා දකින ඇතැම් අයට යේසුස් වහන්සේ මෙම උපමාව වදාළසේක. ලූක් 18:9

39.පරිසිවරු අන් අයට වඩා තමන් උසස් බවට (උතුම්) පමුණුවන්නෝය. ධර්මිෂ්ඨ යැයි ගණන් ගනු ලැබ ගෙදර ගියේ පරිසිවරයා නොව බදු අයකරන්නාය. (අයකැමියා) තමාම උසස් කරගන්නා හැම දෙනම පහත් කරනු ලබති. ලූක් 18:4

40.පරිසිවරු ඔවුන්ගේ නිපුණත්වය (කෞශල්‍යය, සම්පාදනය) ගැන පාරට්ටු කරගන්නෝය. දෙවියන් වහන්ස මා මුදල් වංචා හෝ අසාධාරණ හෝ කාමමිථ්‍යාචාරී නොවන්නෙකි. මා සුමානයකට දෙවරක් උපවාසය කරන්නෙමි. මට ලැබෙන සියල්ලෙන් දසයෙන් කොටස ගෙවන්නෙමි. ලූක් 18:11-12

41.පරිසිවරු අන් අයට චෝදනා කරන්නෝය. පරිසිවරු කාමමිථ්‍යාචාරයේ හැසිරෙද්දිම අසුවූ ස්ත්‍රියක් ගෙනැවිත් උන්වහන්සේට කථාකොට "ගුරුදේවයෙනි මේ ස්ත්‍රිය කාමමිථ්‍යාචාරයෙහි යෙදි සිටියදීම අල්ලාගන්නා ලද්දීය... මෝසෙස් මෙවැනි ස්ත්‍රීන් ගල්ගසා මරන්න යයි අණ කලේය. එහෙත් ඔබවහන්සේ කියන්නේ කුමක්ද"? යොහාන් 8:3-6

42.පරිසිවරු දෙවියන් වහන්සේ ඔවුන්ගේ පියා යයි සිතින් මවා පාගත්තද, සැබැවින්ම ඔවුන්ගේ පියා යක්ෂයාය. යේසුස් වහන්සේ ඔවුන්ට කියන සේක්, දෙවියන් වහන්සේ නුඹගේ පියා වී නම් නුඹ මට ප්‍රේමකරනු ඇත ........ නුඹ නුඹගේ පියාවන යක්ෂයාගෙන්ය. එබැවින් නුඹට අවශ්‍යව ඇත්තේ, නුඹගේ පියාගේ ආශාවන් ඉටුකිරීමය. යොහාන් 8:42-44

43.පරිසිවරු බොරුකාරයෝ සහ මිනීමරුවෝය. යේසුස් වහන්සේ ඔවුන්ට කියමින්. නුඹ නුඹගේ පියාවන යක්ෂයාගෙන්ය. එබැවින් නුඹට අවශ්‍යව ඇත්තේ, නුඹගේ පියාගේ ආශාවන් ඉටුකිරීමය. මුල සිටම ඔහු මිනීමරුවෙකි, සහ සත්‍යය ඔහු තුළ පිහිටා නැති බැවින්, ඔහු සත්‍යයෙහි නොපිහිටියෙහිය. ඔහු බොරු කියන කල ඔහුගේ නියම ස්වභාවයෙන්ම කථාකරයි, මන්ද ඔහු බොරුකාරයෙක් සහ බොරුවේ පියාය. යොහාන් 8:44

44.පරිසිවරු ඔවුන්ට සවන් නොදෙන්නන්ට වධ හිංසා (හිරිහැර) කරන්නෝය. පරිසිවරු ඔහුට (සුවය ලබපු අන්ධ මිනිසාට) කියා සිටියේ. උපන් ද සිටම පාපයේ සිටින ඔබ අපට උගන්වන්න එන්නෙහි දැයි කියා ඔහුව ධර්මශාලාවෙන් නෙරපා දැමූහ. යොහාන් 9:34

45.පරිසිවරු ඔවුන්ට කළ නොහැකි හාස්කම් කරන්නන්ට ඊර්ෂ්‍යා කරන්නෝය. පරිසිවරු කියමින් "අපි කුමක් කරන්නෙමුද? මන්ද මේ මිනිසා බොහෝ හාස්කම් කරයි" එබැවින් ඔවුහු එදා පටන් උන්වහන්සේව මරන්නට කුමන්ත්‍රණය කළෝය. යොහාන් 11:47-53



46.පරිසිවරු ඔවුන් කරන දේ නොකරන දේවභක්තික මිනිසුන් විනිශ්චය කරන්නෝය. පරිසිවරු කියමින් " මේ මිනිහා සබත් විනය කඩන බැවින් ඔහු දෙවියන් වහන්සේ වෙතින් පැමිණියෙක් නොවේ" යොහාන් 9:16

47.පරිසිවරු සංකේත (ලකුණු, දේව බල ප්‍රකාශන) ඉල්ලා, දෙවියන් වහන්සේව පරීක්ෂා කරන්නෝය. පරිසිවරු යේසුස් වහන්සේට කථාකොට ගුරුදේවයෙනි ඔබ සංකේතයක් කරනු දකින්නට අපි කැමැත්තෙමුයි කීහ. මතෙව් 12:38

48.පරිසිවරු නැතිවූ පව්කාරයින් හට තැකීමක් (සංවේගයක්) නොදක්වන්නෝය. ව්‍යවස්ථාව නොදන්නා මේ සෙනඟ ශාප ලද්දෝ යයි පරිසිවරු කීහ. යොහාන් 7:9

49.පරිසිවරු දේව වචනයට වඩා ඔවුන්ගේ සම්ප්‍රදායයන්වලට (චාරිත්‍ර, ආගමික පිළිවෙත්) වටිනා කමක් දුන්නෝය. යේසුස් වහන්සේ පරිසිවරුන්ට කථාකොට මෙසේ වදාළසේක; ඔබේ සම්ප්‍රදායයන් පිළිපදින පිණිස ඔබ දෙවියන් වහන්සේගේ ආඥාව ප්‍රතික්ෂේප (පහකොට) කිරීමට හරි දක්ෂයෝය. මාක් 7:9

50.පරිසිවරු තමන් නිදෙස් බව, හෝ සුදුසු බව, ඔප්පු කරගන්නෝය. යේසුස් වහන්සේ පරිසිවරුන්ට මෙසේ වදාළසේක."ඔබ නම් මිනිසුන් ඉදිරියෙහි ඔබගේ ධර්මිෂ්ඨකම ගැන පාරට්ටු කරගන්නා අය වෙති, එහෙත් දෙවියන් වහන්සේ ඔබගේ හදවත් (සිත්) දන්නාසේක." ලූක් 16:15

විමසීම.

***ලංකා ක්‍රිස්තියානි එකමුතු සභාව***

දැදුරුඔය

හලාවත

ශ්‍රීලංකාව

උපරිම විකුණුම් මිල රු. 20/=